# පුරාවිද්‍යා භූමි ආශ්‍රිතව කෞතුක භාණ්ඩ අලෙවිය සිදු කරන කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ගේ ජීවන තත්ත්වයට කොවිඩ් වසංගතය හමු සිදු වූ බලපෑම හඳුනා ගැනීම

තෙන්නකෝන් එන්.ටී.එම්.වී.එම්,[1] දිලාන් කේ.ටී.එස්,[2] කුමාර ඒ.පී.එස්.එන්.[3]

පුද්ගලයින් සිය රුචිකත්වයට මත ඒකරාශි කරන ලද පැරණි භාණ්ඩ වල එකතුන් වර්තමානය වන විට ලොව පුරා ව්‍යාප්තව පවති. මෙම තත්ත්වය හමුවේ කුඩා පරිමාණ වයවසායකයින්ද මූලික වශයෙන් සංචාරක අවශ්‍යතා පදනම් කර ගනිමින් තම ව්‍යාපාරයත් ගොඩ නගාගෙන ඇති ආකාරය දැකගත හැකිය. ඒ අතර කෞතුක භාණ්ඩ අලෙවිය ප්‍රමුඛත්වයක් උහුලයි. ඒ තුල පුරාවිද්‍යා භාණ්ඩ කෙරෙහි වැඩි සංචාරක ආකර්ශනයක් දැකගත හැකිය. එහිදී මෙම පුරාවිද්‍යා භූමි ආශ්‍රිතව කෞතුක භාණ්ඩ වෙළෙඳාමෙ නිරත වන කුඩා පරිමාණ ව්‍යවසායකයින්ගෙ ජීවන තත්ත්වය කොවිඩ් වසංගතය හමුවේ සිදු වී ඇති බලපෑම් පිළිබඳව අධ්‍යනය කිරීම මෙම අධ්‍යනය හරහා සිදු වේ. ඒ අනුව අදාළ ව්‍යාපාරිකයින් මේ වන විට පත්ව ඇති තත්ත්වය හඳුනා ගැනීමත් ඔවුන්ගෙ ජීවන තත්ත්වය හා ව්‍යාපාරිකයින්ගෙ පැවැත්ම තහවුරු කිරීමට අවශ්‍ය වැඩපිළිවෙළක් හඳුනා ගැනීමත් මෙම අධ්‍යනය තුළින් මූලික ලෙස අරමුණු කර ඇත. මෙම අධ්‍යනය සඳහා අධ්‍යයන ප්‍රදේශය ලෙස අනුරාධපුර පූජා නගරයේ කුට්ටම්පොකුණ, බිසෝමාලිගය, සහ සමාධි බුදුපිළිමය ආශ්‍රිතව කෞතුක භාණ්ඩ වෙළෙඳපොළේ දසදෙනකු, සසම්භාවී නොවන නියැදි ක්‍රමය යටතේ පහසු නියැලීමේ ක්‍රමය මගින් තෝරාගත් අතර ප්‍රශ්නාවලි සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදාගනිමින් දත්ත රැස්කිරීම සිදු කරන ලදි. මෙම අධ්‍යයනයේදී මූලික වශයෙන් කෞතුක භාණ්ඩ වෙළෙඳුන් හට පැවති ගැටලු කීපයක් හඳුනාගත හැකිවිය. ප්‍රධාන වශයෙන් කොවිඩ් වසංගතය හමුවේ සංචාරකයින්ගේ පැමිණීම අවම වීම, සෞඛ්‍ය ආරක්ෂිත ජෛව බුබුල ක්‍රමය හේතුවෙන් සංචාරක මගපෙන්වන්නන් විසින් වෙළෙඳසැල් මගහරවා යාම, වසංගතය තත්ත්වය හමුවේ දේශීය සංචාරකයින් පවා වෙළෙඳසැල් වෙත ඒම ප්‍රතික්ෂේප කිරීම ආදිය ඒ අතර වේ. මෙම තත්ත්වය හේතුවෙන් සාමාන්‍ය ලෙස දෛනිකව රු.5000-7000 අතර පැවති ආදායම් මට්ටම මේ වන විට රු.300- 1400 අතර මට්ටමකට පත්ව ඇති බව පැහැදිලි විය. මේ තත්ත්වයෙන් ව්‍යාපාරිකයින් ආරක්ෂා කරගනිමින් ඔවුන්ගෙ ජීවන තත්ත්වය උසස් මට්ටමක පවත්වාගෙන යාම සඳහා මූලික ලෙස රජය මැදිහත් විම හරහා මෙම ව්‍යාපාරිකයින් හට ව්‍යාපාරයන් පවත්වාගෙන යාමට අවශ්‍ය පරිසරයක් නිර්මාණ කිරීමත්, කෞතුක භාණ්ඩ ආශ්‍රිතව උසස් මට්ටමක ව්‍යාපාරික ස්ථානයක් බවට පත්කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරිම වඩා වැදගත් වේ. එමෙන්ම අනපේක්ෂිත අවස්ථාවන්ට ව්‍යාපාරිකයින් හට මුහුණ දීමට රක්ෂණ ක්‍රම, රාජ්‍ය බැංකු පද්ධතිය හරහා ලබා දෙන ණය යෝජනා ක්‍රම ආදිය හදුන්වා දීම අත්‍යවශ්‍ය බව මෙම අධ්‍යයනය හරහා ගම්‍ය විය.

**මුඛ්‍ය පද :** ව්‍යවසායකයන්, කෞතුක භාණ්ඩ, සංචාරකයින්, අධ්‍යයන

[1,2,3]ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රීලංකා රජරට විශ්වවිද්‍යාලය. wirangamadusanka2@gmail.com